# ක්‍රිස්තියානි ධර්මය

## 2 ශ්‍රේණිය

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව



සියලු ම පෙළපොත් ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයෙන් ලබා ගැනීමට
www.edupub.gov.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

පළමු වන මුද්‍රණය 2016
දෙවන මුද්‍රණය 2017
තුන්වන මුද්‍රණය 2018
හතරවන මුද්‍රණය 2019
පස්වන මුද්‍රණය 2021

සියලුම හිමිකම් ඇවිරිණි.

ISBN 978-955-25-0224-8

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
නො: 2/60, රවුම් පාර, දිවුලපිටිය, සරස්වතී ප්‍රකාශන ආයතනයෙහි
මුද්‍රණය කරවා ප්‍රකාශයට පත් කරන ලදි.

Published by : Educational Publications Department
Printed by : Saraswathi Publications,
No. 2/60, Circular Road, Divulapitiya.

# ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා
අපහට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
ඔබ වේ අප විද්‍යා  ඔබ ම ය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති  අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ  අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ  අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජය භූමි කරා
එක මවකගෙ දරු කැල බැවිනා
යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරැර ද නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

අපි වෙමු එක මවකගෙ දරුවෝ
එක නිවසෙහි වෙසෙනා
එක පාටැති එක රුධිරය වේ
අප කය තුළ දුවනා

එබැවිනි අපි වෙමු සොයුරු සොයුරියෝ
එක ලෙස එහි වැඩෙනා
ජීවත් වන අප මෙම නිවසේ
සොඳින සිටිය යුතු වේ

සැමට ම මෙත් කරුණා ගුණෙනී
වෙළී සමගි දමිනී
රන් මිණි මුතු නො ව එය ම ය සැපතා
කිසි කල නොම දිරනා

ආනන්ද සමරකෝන්

# පෙරවදන

'අධ්‍යාපනය' ලෝකය වෙනස් කළ හැකි ප්‍රබලතම අවිය වේ. එසේම පුද්ගලයාට තම ජීවිතයේ යහපත් වෙනස්වීම් සඳහා හැඩගැසීමේ හැකියාව ලබා දෙන්නේ ද අධ්‍යාපනයයි. ඉහළ ගුණාත්මක බවකින් යුතු පෙළපොත් සම්පාදනය කරමින් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව සැමට අධ්‍යාපනය ලබා දීමේ මාහැඟි මෙහෙවරට උර දී සිටියි.

නිදහස් අධ්‍යාපනයේ අනගි තිළිණයක් ලෙස ඔබ දෝතට නොමිලේ පිරිනැමෙන මෙම පෙළපොත වටිනා ඉගෙනුම් ආධාරකයකි. ශීඝ්‍රයෙන් වෙනස් වන නව ලෝකය හමුවේ ඇති අභියෝග ජය ගෙන දිරියෙන් නැගී සිටීමට, ඔබට මෙම පෙළපොත මග පෙන්වනු ඇත. පෙළපොත, කියවීමට පමණක් සීමා නොකර, ඒ ඔස්සේ ඔබ සැම තව තවත් දැනුම වර්ධනය කර ගැනීමට උනන්දු විය යුතු ය. යහපත් ලෙස ජීවත් වීමට අවශ්‍ය කුසලතා අත්පත් කර ගත් සාර්ථක පුරවැසියකු වී, අනාගත ලොව දිනන්නට මේ පෙළපොත ඔබට අත්වැලක් වෙතැයි මම අපේක්ෂා කරමි.

පෙළපොත් සම්පාදන කාර්යය සඳහා අගනා දායකත්වයක් සැපයූ ලේඛක, සංස්කාරක හා ඇගයුම් මණ්ඩල සාමාජික පිරිවරටත්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලයේ සැමටත් මාගේ ප්‍රණාමය පුද කරමි.

පී.එන්. අයිලප්පෙරුම<br>
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්,<br>
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව,<br>
ඉසුරුපාය,<br>
බත්තරමුල්ල.<br>
2021.05.05

**නියාමනය හා අධීක්ෂණය**

පී. එන්. අයිලප්පෙරුම - අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**මෙහෙයවීම**

ඩබ්ලිව්.ඒ. නිර්මලා පියසීලි - අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් (සංවර්ධන)
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**සම්බන්ධීකරණය**

ආර්.ඩී. විජේවික්‍රම - නියෝජ්‍ය කොමසාරිස්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

ඩී.එම්. මල්කා මිලානි - සහකාර කොමසාරිස් (2021 නැවත මුද්‍රණය)
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**සහාය සම්බන්ධීකරණය**

එස්.ජී.ඩී.එන්.එල්. සමරකෝන් - සහකාර කොමසාරිස්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**සංස්කාරක මණ්ඩලය**

ගරු ජේ. ඒ. මිහිරි ද සිල්වා දේවගැතිතුමිය - ලේකම්, ක්‍රිස්තියානි අධ්‍යාපන කොමිසම,
ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය,
බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු - විදුහල්පති, බප/පිළි/ධම්මරතන විද්‍යාලය,
ඉදිබැද්ද, මොරටුව.

ගෞ. සී. ඩබ්. සී. බාල්රාජ් දේවගැතිතුමා - විදුහල්පති, ශාන්ත තෝමස් විදුහල,
බණ්ඩාරවෙල.

**ලේඛක මණ්ඩලය**

එස්. පී. සී. ප්‍රනාන්දු - ගුරු වෘත්තිය, වෙස්ලි විද්‍යාලය
කොළඹ 06

ඒ. කිතුමිණි සල්ගාදු - ගුරු වෘත්තිය, බප/මීග/ කටුනායක ම.වි,
කටුනායක.

එම්. පී. සෙල්වනිදි පෙරේරා - ගුරු වෘත්තිය, (විශ්‍රාමික)

**භාෂා සංස්කාරක**

රංජිත් ඉලුප්පිටිය - නියෝජ්‍ය කොමසාරිස්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**චිත්‍ර හා පිටකවරය**

ඩී. ප්‍රසාද් නිශාන්ත පීරිස් - ගුරු වෘත්තිය, ශාන්ත පීතර විදුහල,
කොළඹ 04.

**පරිගණක අක්ෂර සංයෝජනය හා පිටු සැලසුම්කරණය**

එල්. ඒ. සඳුනි නිලංකා පත්මසිරි - පරිගණක සහායක,
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

# පටුන

පිටු අංකය



| | | |
|---|---|---|
| 1. | දෙවිඳුන් දුන් මනහර ලොව | 1 |
| 2. | මගේ ලෝකය ලස්සනයි | 2 |
| 3. | අපි හොඳ ළමයි වෙමු | 3 |
| 4. | දේවස්ථානයේ පවුල | 5 |
| 5. | ආදරයෙන් ජීවත් වෙමු | 7 |
| 6. | යහපත් කිතුනු ගුණාංග | 9 |
| 7. | දේව මාලිගාවට ගිය ජේසුස් වහන්සේ | 12 |
| 8. | ජේසුස් වහන්සේගේ බව්තීස්මය | 14 |
| 9. | කානාහි විවාහ මංගල්‍යය | 16 |
| 10. | සැම දේ සපයන දෙවි පියාණන් වහන්සේ | 18 |
| 11. | ගේකුරුල්ලන්ගෙන් පාඩමක් | 20 |
| 12. | යාච්ඤාව | 22 |
| 13. | ප්‍රේමය ප්‍රීතිය සාමය | 24 |
| 14. | සමගි වූ ඒසව් හා ජාකොබ් | 26 |
| 15. | සැබෑ මිතුරුකම | 28 |
| 16. | කරුණාව දක්වමු | 30 |
| 17. | වපුරන්නාගේ උපමා කථාව | 32 |
| 18. | රජ කුමරියගේ රැකවරණය ලද මෝසෙස් | 34 |
| 19. | නැති වූ පුත්‍රයාගේ උපමා කථාව | 36 |
| 20. | දේව වචනය අසා පිළිපදිමු | 39 |

**ක්‍රියාකාරකම්** 41 - 47

# 1

# දෙවිඳුන් දුන් මනහර ලොව

(උත්පත්ති 1 : 9-10, ගීතාවලිය 104 : 6-16)



අහස පොළොව වෙන් කරලා
ජලය වෙන ම රැස් කරලා
මහ පොළොවයි මහ මුහුදයි
දෙවිඳුන් මැවුවා

හෝ ගා ගලනා ඇළ දොළ
කඳු අතරින් ගලා ඇවිත්
මිටියාවත් මැදින් ගිහින්
පොළොව සරු කළා

සිසිල ගෙනෙන තුරු සෙවණින්
පිබිදෙන මේ සුවඳ කුසුම්
රසබර පලතුරු සමගින්
අපහට දුන්නා

**නමදිමු අපි උදේ හවා ලෝකය මැවූ දේව පියා**

**2**

# මගේ ලෝකය ලස්සනයි

(උත්පත්ති 1 : 20, 22-25)



දුර අහසේ පියාසලන
ගස් අතු අග කූඩු සදන
මිහිරි නාද කරමින් යන
පුංචි කුරුල්ලෝ

වනයෙ සිටින සිවුපාවුන්
බඩගා යන උරග සතුන්
පුදුම සිතෙන නොයෙක් සතුන්
සිත පිනවන්නේ

පාට පාට නොයෙකුත් හැඩ
වරල් සලා පිහිනා යන
ලොකුයි පොඩියි සැම මාළුන්
දෙවිඳුන් දුන්නේ

**දෙවි පියාණන් දුන් මේ සියලු දේ ගැන ස්තුති වේවා!**

උපදෙස් :- 1 හා 2 පාඩම්වලට අදාළ ක්‍රියාකාරකම පිටු අංක 41හි ඇත.

3

# අපි හොඳ ළමයි වෙමු

(ශු. ලූක් 2 : 51-52)



ජේසුස් වහන්සේ තම දෙමවුපියන්ට බොහෝ සේ ආදරය කළ සේක.

කීකරු වූ සේක.

තම පියාට උදවු කළ සේක.

තම මවටත් උදවු කළ සේක.

ජේසුස් වහන්සේ දෙමවුපියන්ගේ ආදරය හා රැකවරණය මැද සතුටින් ජීවත් වූ සේක.
අපිත්, ජේසුස් වහන්සේ මෙන්
අපේ දෙමවුපියන්ට කීකරු වෙමු.
උදවු කරමු
ආදරය කරමු
හොඳින් වැඩෙමු.

**මගේ පවුල ගැන දෙවියන් වහන්සේට ස්තූතියි!**



**පැවරුම**

නිවැරදි පිළිතුර තෝරා යා කරන්න.

| | |
|---|---|
| ජේසුස් වහන්සේගේ දරුවෙකු වන මම | ★ අම්මාට උදවු කරමි. |
| | ★ ගුරුවරුන්ට කීකරු වෙමි. |
| | ★ කුරුල්ලන්ට ගල් ගසමි. |
| | ★ රෝගීන්ට පිහිට වෙමි. |
| | ★ මා සතු දේ බෙදා ගනිමි. |
| | ★ හොඳින් ඉගෙන ගනිමි. |

## 4

# දේවස්ථානයේ පවුල

(ක්‍රියා 2 : 46-47)



ඉරිදා දවස කිතුනු අපට ඉතා ම වැදගත්.

සැම ඉරිදාවක ම අපි පවුල් වශයෙන් එක් වී දේවස්ථානයට යමු.

අපි පවුලක් ලෙස එකමුතු ව දෙවියන් වහන්සේට ප්‍රශංසා කරමු.



නමස්කාර කරමු.

දේව වචනය ඉගෙන ගනිමු.

එකිනෙකාට උදවු කරමු.

දේවස්ථානය තුළ සිටින අපි සැම එක ම පවුලක් වෙමු.

**එකමුතු පවුලට මම ආදරෙයි.**



**පැවරුම**

පහත සඳහන් වගන්ති කියවා හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද දමන්න.

1. අපි සැම ඉරිදාවක ම දේවස්ථානයට යමු. ( )
2. අපි එකතු ව දෙවියන් වහන්සේට ප්‍රශංසා කරමු. ( )
3. අපි සැවොම එක ම පවුලක් ලෙස නොසිටිමු. ( )
4. අපි දේව වචනය ඉගෙන ගනිමු. ( )
5. අපි එකිනෙකාට උදවු නොකරමු. ( )

# 5

# ආදරයෙන් ජීවත් වෙමු

(ශුද්ධ මතෙව් 25 : 35-36)

බඩගිනි අයකු සොයා
කෑම ටිකක් සපයා
දුනහොත් ජේසුස් හිමි පවසයි
ඔබ එය කළේ මටයි ...

නංගී : "අයියේ... ඔයාට ඇහෙනවා ද ඒ ගීතිකාව? හරි ම... ලස්සනයි"

අයියා : "ඔව් නංගී, හරි ම ලස්සනයි. ජේසුස් වහන්සේ අනෙක් අයට උදවු කරන්න කියලයි අපිට කියන්නේ."

නංගී : අයියේ, අපි අනුන්ට කරන ඕනෑ ම උදව්වක් ජේසුස් වහන්සේට කරන උදව්වක් ද? අපි අම්මගෙන් අහමු...
අම්මේ...

අම්මා : ඔව්... දුව... අඳින්න නැති අයට ඇඳුම් දෙන එක, ලෙඩ වුණු අය බලන්න යන එක, අසරණයන්ට පිහිට වෙන එක, මහලු අයට උදවු කරන එක, දුකට පත් වුණු අය සනසන

එක, මේ හැම දෙයක් ම ජේසුස් වහන්සේ වෙනුවෙන් ම කරන දේවල්.

නංගී : "ඔව් අම්මේ, ජේසුස් වහන්සේ අපිට කිව්ව විදිහට අපි හැමෝටම උදවු කරමු."

අම්මා : මගේ හොඳ දුව, මගේ හොඳ පුතා, දෙවි පියාණන් වහන්සේට ස්තුති වේවා!

**මම ද අන් අයට උදවු කිරීමට කැමැත්තෙමි.**



පැවරුම

1. ඔබ අන් අයට උදවු කරන අවස්ථාවක් චිත්‍රයට නගන්න.


# 6

# යහපත් කිතුනු ගුණාංග

(රෝම 12 : 10-13)

## කතන්දරය කියවා කිතුනු ගුණාංග වඩවා ගනිමු

දවසක් කවිඳු තම පියා සමග දුර ගමනක් ගියා. එදා මහා වැසි දවසක්. හදිසියේ ම ඔවුන්ගේ ත්‍රිරෝද රථය නතර වුණා. ඔවුන් වාහනය හදාගන්න හුඟාක් උත්සාහ කළා. ඔවුන් ඉවසිල්ලෙන්, නොකඩවා ම දෙවියන් වහන්සේට යාච්ඤා කළා.



ටික වේලාවකට පසු එතැනින් වෑන් රථයක් ගමන් කළා. එහි සිටි පිරිස කරදරයට පත් ව සිටි දෙදෙනා දැක වෑන් රථය නතර කළා.


මහා වැස්ස නොතකා අසරණ වී සිටි ඔවුන්ට උදවු උපකාර කළා. කවිඳු ළඟ අලසකමක් තිබුණේ ම නැහැ. වෑන් රථයේ සිටි හැම දෙනා ම කඩිසර ව කැඩුණු වාහනය හදන්න උදවු කරමින් දේව ප්‍රේමය දැක්වූවා.

**යහපත් කිතුනු දරුවන් සේ ක්‍රියා කරමු.**



## පැවරුම

පහත දැක්වෙන රූපයෙහි සඳහන් කරුණුවලින් කිතුනු දරුවකු තුළ තිබිය යුතු ලක්ෂණ පමණක් තෝරා පාට කරන්න.



7

# දේව මාලිගාවට ගිය ජේසුස් වහන්සේ

(ශුද්ධ ලූක් 2 : 46-47)



දොළොස් හැවිරිදි ජේසුස් වහන්සේ ජෙරුසලම් දේව මාලිගාවට ගිය සේක. ජේසුස් වහන්සේ දේව මාලිගයේ නැවතුණ සේක; එහි සිටි පඬිවරුන් කතා කළ දෙයට සවන් දෙමින් පඬිවරුන්ගෙන් ප්‍රශ්න විචාරමින් සිටි සේක.

ජේසුස් වහන්සේගේ දෙමවුපියෝ එතුමා සොයමින් නැවත දේව මාලිගාවට පැමිණියහ. ඔවුන් දෙදෙනා ද රැස් ව සිටි සියල්ලෝ ද ජේසුස් වහන්සේගේ දැනුම ගැන මවිත වූහ. දුන් පිළිතුරු ගැන පුදුමයට පත් වූහ.

ජේසුස් වහන්සේ මෙන් අපිත් දෙවි පියාණන් ගැන ඉගෙන ගනිමු. දේව වචනයට කීකරු වෙමු.

**ජේසුස් වහන්සේ ගැන ඉගෙන ගැනීමට හැම ඉරිදා ම මම දෙව්මැදුරට සහ ඉරුදින පාසලට යමි.**



**පැවරුම**

පහත වගන්ති කියවා ඊට අදාළ නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1. ජේසුස් වහන්සේ ජෙරුසලම් දේව මාලිගාවට ගියේ අවුරුදු (හයේ දී / දොළහේ දී)
2. ජේසුස් වහන්සේ ප්‍රශ්න විචාරමින් සිටියේ (පූජකයන් සමග / පඬිවරුන් සමග)
3. ජේසුස් වහන්සේගේ දෙමවුපියෝ එතුමා සොයා (පැමිණියේ නැත / පැමිණියහ)
4. අපි දේව වචනයට (කීකරු වෙමු / කීකරු නොවෙමු)

# 8

# ජේසුස් වහන්සේගේ බව්තීස්මය

(ශුද්ධ මාක් 1 : 9-11)



ජේසුස් වහන්සේ ගලීලයේ නාසරෙත් නුවරින් පිටත් ව ආ සේක. ඒ දවස්වල දී ස්නාවක ජොහන් තුමා ජොර්දන් ගඟෙහි සෙනඟ බව්තීස්ම කරමින් සිටියේ ය.

ජේසුස් වහන්සේ ද ඒ අතරට එක් විය. ජොහන්තුමා ජේසුස් වහන්සේ බව්තීස්ම කළේ ය.

එවිට මහත් පුදුම දෙයක් සිදු විය. එනම් ආත්මයාණන් වහන්සේ පරෙවියකු මෙන් වැඩම කළ සේක.

ඒ මොහොතේ තවත් පුදුම දෙයක් සිදු විය. එනම් අහසින් නික්මුණු හඬයි. ඒ හඬ නම් "ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝ ය. ඔබ කෙරෙහි ඉතා ප්‍රසන්න ව සිටිමි" යි යන්න ය.

මේ, දෙවියන් වහන්සේ ජේසුස් වහන්සේ ගැන කියූ වචනයයි.

**බව්තීස්මයේ දී දේව පුත්‍රයා බව එළිදරවු වූ ජේසුස් වහන්සේට නමස්කාර කරමු.**

*උපදෙස් :- 8 පාඩමට අදාළ ක්‍රියාකාරකම පිටු අංක 42හි ඇත.*

9

# කානාහි විවාහ මංගල්‍යය

(ශුද්ධ ජොහාන් 2 : 1-12)



ගලීලයේ කානා නුවර විවාහ මංගල්‍යයක් තිබුණා. ජේසුස් වහන්සේත්, මෑණියෝත් එහි සිටියා. එදා ටික වේලාවකින් මගුල් ගෙදර මිදි යුෂ ඉවර වුණා. සෙනඟට දෙන්නට මදි වුණා. ජේසුස් වහන්සේගේ මෑණියෝ මිදි යුෂ නැතැයි උන්වහන්සේට කීවා. ඒ වගේ ම ජේසුස් වහන්සේ කියන ඕනෑ ම දෙයක් කරන්න කියා සේවකයන්ට කිවුවා. ජේසුස් වහන්සේ මෑණියන්ගේ හඬට සවන් දී එතැන තිබූ ගල් භාජන හයකට වතුර පුරවන්නැයි කී සේක.



එවිට මේ වතුර මිදි යුෂ බවට පත් විය. ඒවා ඉතා රසවත් මිදි යුෂ බව හැමෝ ම කිවුවා.

## ජේසුස් වහන්සේ කළ පළමු හාස්කම මෙයයි



**පැවරුම**

- පහත වැකි කියවා හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද දමන්න.

1. ජේසුස් වහන්සේ විවාහ මංගල්‍ය උත්සවයට ගියේ කානා නුවරට ය. (    )
2. ජේසුස් වහන්සේගේ පියා ද එහි සිටියා. (    )
3. විවාහ මංගල්‍යයේ දී මිදි යුෂ ඉවර විය. (    )
4. සේවකයෝ ගල් භාජන හතකට වතුර පිරවූහ.(    )
5. ජේසුස් වහන්සේ කළ පළමු හාස්කම වතුර මිදි යුෂ බවට පත් කිරීමයි. (    )

# 10


# සැම දේ සපයන දෙවි පියාණන් වහන්සේ

(ශුද්ධ මතෙව් 6 : 25-28)

දෙවි පියාණන් වහන්සේ අපට වුවමනා සියලු දේ සපයා දෙන බව ජේසුස් වහන්සේ ඉගැන්වූ සේක.

අහසේ කුරුල්ලන් වපුරන්නේ නෑ. අස්වැන්න කපා අටුවල රැස් කරන්නේ නෑ. ඒත් දෙවියන් වහන්සේ කුරුල්ලන්ට ආහාර සපයා දෙන සේක.

නිල් මානෙල් මල් හරි ම ලස්සනයි. මානෙල් මල් වෙහෙසෙන්නේ නෑ. ඒවා නූල් කටින්නේ නෑ.



ජේසුස් වහන්සේ අපට කියා දුන්නේ, ආහාර ගැනවත්, ඇඳුම් ගැනවත්, කරදර නොවන ලෙසයි. දෙවියන් වහන්සේ අපට ඒ සියලු දේ සපයා දෙන සේක.

**සියල්ල සපයන දෙවි පියාණන් වහන්සේට ස්තූති වේවා!**

උපදෙස් :- 10 පාඩමට අදාළ ක්‍රියාකාරකම පිටු අංක 43හි ඇත.

# 11

# ගේකුරුල්ලන්ගෙන් පාඩමක්


(ශුද්ධ මතෙව් 10 : 29-31)

කුරුල්ලන් අතරින් ගේකුරුල්ලා කුඩා ම කුරුල්ලෙක්. ඔවුන් බිත්තර දමන කාලයට ගෙවල් ආශ්‍රිත ව කූඩු හදනවා.

බිත්තරය පුපුරා පුංචි පැටවා එළියට පැමිණි විට ඔවුන් ලොකු වන තුරු ආරක්ෂිත ව වැඩෙනවා. ගේකුරුල්ලන්ට පුංචි ළමයි හරි ම ආදරෙයි.

පුංචි ඔබ මවා තිබෙන්නේත් දෙවියන් වහන්සේ යි. ඔබේ ජීවිතය දෙවියන් වහන්සේට හුඟක් වටිනවා. උන්වහන්සේ ඔබ රැක බලා ගන්නවා.

**පුංචි ඔබත් වටිනා කෙනෙක්!**



පුංචි කුරුල්ලන්ට පවා
ආදරේ ඇති
දෙවිඳු මට ආදරේ බව
මම දනිමි.

## ඔව්, මම වටිනා කෙනෙක්!



පැවරුම


- කොටුව තුළ ඔබගේ රූපය ඇඳ පාට කරන්න. තිත් ඉරි මත ඔබගේ නම ලියන්න.

---------------------------------------------

12

# යාච්ඤාව

(ශුද්ධ මතෙව් 6 : 9-13)



ජේසුස් වහන්සේ ඉගැන්වූ යාච්ඤාව අපිත් ඉගෙන ගනිමු.

ස්වර්ගයේ වැඩ වසන
අපගේ පියාණෙනි,
ඔබ වහන්සේගේ නාමයට
ගෞරව වේවා!
ඔබ වහන්සේගේ රාජ්‍යය
පැමිණේවා!
ඔබ වහන්සේගේ කැමැත්ත
ඉටු වේවා!

ස්වර්ගයෙහි මෙන් පොළොවෙහි ද
එසේ ම වේවා!
අපගේ දවස්පතා ආහාරය
අද අපට දුන මැනව.
අපට වරද කළ අයට
අප කමා කළාක් මෙන්
අපේ වරදට
අපට කමා වුව මැනව.
අප පරීක්ෂාවට නොපමුණුවා
නපුරාගෙන් අප මිදුව මැනව.
ආමෙන්!
කුමක් නිසා ද රාජ්‍යයත්, බලයත්, මහිමයත්
සදහට ම ඔබ වහන්සේගේ ය.
ආමෙන්.

සැම විට ම යාච්ඤාවේ යෙදෙමු.




පැවරුම

1. ස්වාමීන් වහන්සේ ඉගැන්වූ යාච්ඤාව කට පාඩම් කරන්න.

# 13

# ප්‍රේමය ප්‍රීතිය සාමය

(ගලාති 5 : 22)




ශුද්ධාත්මයාණන් වහන්සේ මා තුළ වැඩ සිටින සේක.
උන්වහන්සේ මා තුළ සිටින නිසා,
මම සැමට ම ප්‍රේම කරමි.
ප්‍රීතියෙන් ජීවත් වෙමි.
සාමයෙන් ක්‍රියා කරමි.

**මම ප්‍රීතිමත් ළමයෙක් වෙමි.**



## පැවරුම

1. මැද රවුමේ ඇති වචනයට ගැළපෙන වචන ඇති රවුම් පාට කරන්න. ඒවා ඉරකින් මැද රවුමට යා කරන්න.

නපුරුකම

ප්‍රේමය

ශුද්ධාත්මයාණන් වහන්සේ

ප්‍රීතිය

අකීකරුකම

සාමය

14

# සමගි වූ ඒසව් සහ ජාකොබ්

(උත්පත්ති 33 : 3-11)




ඒසව් සහ ජාකොබ් සහෝදරයෝ. ජාකොබ් ඒසව්ට වරදක් කළ නිසා ඔවුන් අසමගියෙන් පසු වූවා. ඔවුන් එකිනෙකාගෙන් වෙන් ව ජීවත් වූවා.

කාලයක් ගත වූ විට ජාකොබ්, ඒසව් සොයාගෙන ගියා. ඔවුන් මුණ ගැසුණ විට, ඒසව් ජාකොබ්ට සමාව දුන්නා.

සහෝදරයන් දෙදෙනා ගෙල වැලඳගෙන හැඬුවා.
ජාකොබ් ඒසව්ට තෑගි දුන්නා.
ඒසව් එම තෑගි වුවමනා නැති බව පැවසුවා. එහෙත් ජාකොබ්ගේ බලවත් ඉල්ලීම නිසා පිළිගත්තා.
ඒ දවස දෙදෙනාට ම බොහොම ප්‍රීතිමත් දවසක් වුණා.

**අපි අපේ සහෝදර සහෝදරියන් සමග සමගියෙන් සිටිමු.**



**පැවරුම**

ජාකොබ් හා ඒසව් සමගි වූ කතාව රඟ දක්වන්න.

# 15

# සැබෑ මිතුරුකම

(1 සාමුවෙල් 20 : 41 B - 42)



ජොනතන් හා දාවිත් හොඳ යාළුවෝ.

ජොනතන්ගේ පියා සාවුල් රජතුමායි.

සාවුල් රජ දාවිත්ට ඊර්ෂ්‍යා කළ නිසා දාවිත්ගේ ජීවිතය විනාශ කරන්න උත්සාහ කළා.

ඒත් ජොනතන් තම මිතුරාට හිංසාවක් වනවාට කැමති වුණේ නෑ.

සාවුල් රජුගෙන් බේරීමට දාවිත්ට සැඟවෙන්නට සිදු වුණා.

මිතුරන් දෙදෙනා වෙන් වීමට පෙර එකිනෙකා සිඹගෙන හැඬුවා.

ඔවුන් දෙදෙනා හැම දා ම මිතුරන් සේ සිටින්නට පොරොන්දු වුණා.

**ජොනතන් හා දාවිත් මෙන් අපිත් සැබෑ මිතුරන් ලෙස ක්‍රියා කරමු.**

උපදෙස් :- 15 පාඩමට අදාළ ක්‍රියාකාරකම පිටු අංක 45හි ඇත.

# 16

# කරුණාව දක්වමු

(2 සාමුවෙල් 9 : 1-13)



දාවිත්ගේ මිතුරා වූ ජොනතන්ට පාද කොර වූ පුතෙක් සිටියා. ඔහුගේ නම මෙපිබොෂෙත්.

දාවිත් පසු කලෙක රජ වුණා. ජොනතන් යුද්ධයේ දී මිය ගොස් තිබුණා. දාවිත් තම මිතුරු ජොනතන්ගේ පුත් මෙපිබොෂෙත් රජ මාළිගයට කැඳෙව්වා. රජ සමග නිතර ම කෑම මේසයේ ආහාර ගැනීමට සැලසුවා.

දාවිත් රජ ශිබා නම් මෙහෙකරුට මෙපිබොෂෙත් රැක බලාගන්නට පැවරුවා. මෙපිබොෂෙත් වෙනුවෙන් වගා කර අස්වැන්න රැස් කරන්නට ද කිවුවා.

දාවිත් රජ සාවුල්ගේ පරම්පාරවේ ඉතිරි වූ මෙපිබොෂෙත්ට මෙලෙස කරුණාව පෑවා.

**අපිත් එලෙස සමාජය තුළ කරුණාවෙන් ක්‍රියා කරමු.**




**පැවරුම**

ඔබ ඔබේ මිතුරෙකුට/මිතුරියකට කරුණාව පෑ අවස්ථාවක් චිත්‍රයට නඟා පාට කරන්න.

# 17

# වපුරන්නාගේ උපමා කථාව

(ශුද්ධ ලූක් 8 : 4-8)



දිනක් වපුරන්නෙක් බීජ වපුරන විට සමහර බීජ;

1. මඟ අසල වැටුණි ⟶ කුරුල්ලෝ අහුලාගෙන කෑවෝ ය.

2. ගල් අතර වැටුණි ⟶ වතුර නැති නිසා වියළී ගියේ ය.

3. කටු අතරේ වැටුණි ⟶ පැළ යට කර ගෙන කටු පඳුරු වැඩුණි.

4. සරුබිමේ වැටුණි ⟶ හොඳින් වැඩී පල දැරුවේ ය.

පුංචි මම ද සරුබිමේ වැටුණු බීජයක් මෙන් දෙවියන්
වහන්සේ තුළ යහපත් කිතුනු ළමයෙක් වෙමි.



උපදෙස් :- 17 පාඩමට අදාළ ක්‍රියාකාරකම පිටු අංක 44හි ඇත.

# 18

# රජ කුමරියගේ රැකවරණය ලද මෝසෙස්

(නික්මයාම 2 : 1-10)

සැම හෙබ්‍රෙව් පිරිමි දරුවකු ම නයිල් ගඟට විසි කිරීමට නපුරු රජෙක් අණ කළා. අම්මා කෙනෙක් තම පුතා මාස තුනක් ගෙදර සඟවා ගෙන සිටියා. තව දුරටත් සඟවා තබා ගැනීමට නොහැකි වූ විට පන් පෙට්ටියක් ගෙන කීල් හා මැලියම් ගෑවා. බබා එම පෙට්ටියේ තැබුවා. ඉන් පසු එම පෙට්ටිය ගං ඉවුරේ බට ගස් අතර සැඟවූවා. බබාට කුමක් වේ දැයි දැන ගැනීමට බබාගේ අක්කා ඈතින් බලා සිටියා.





ගඟෙන් දිය නෑමට රජුගේ දූ කුමරිය සේවිකාවන් ද සමග පැමිණියා.

පන් පෙට්ටිය දුටු රජ කුමරිය සේවිකාවක් යවා පෙට්ටිය ගෙන්වා ඇර බැලුවා.

එහි කුඩා දරුවා අඬමින් සිටියා. "මේ හෙබ්‍රෙව් ජාතික දරුවෙකි," යි කුමරිය කිවුවා.

දරුවාගේ අක්කා දුව විත් "බබාට කිරි දෙන්නට කිරි මවක් ගෙනෙන්න ද?" කියා කුමරියගෙන් ඇසුවා.
රජ කුමරිය ඊට කැමති වූ නිසා අක්කා, දරුවාගේ ම අම්මා කැඳවාගෙන ආවා.
රජ කුමරිය දරුවාට කිරි දීමට අම්මාට භාර කළා.





දරුවා වැඩුණු පසු, රජ කුමරිය වෙත අම්මා දරුවා ගෙනාවා.
දරුවා රජ කුමරිය සමග පුතෙකු සේ වැඩුණා.
දරුවා කුඩා කල වතුරෙන් ගොඩ ගත් නිසා ඔහුට මෝසෙස් යයි නම තැබුවා.

**දෙවියන් වහන්සේ රජ කුමරියක මගින් මෝසෙස්ට දේව රැකවරණය ලබා දුන් සේක.**

# 19

# නැති වූ පුත්‍රයාගේ උපමා කථාව

(ශුද්ධ ලූක් 15 : 11-24)

(එක්තරා පියෙකුට පුතුන් දෙදෙනෙක් සිටියා. බාල පුතා පියාට අකීකරු විය. දිනක් ඔහු පියාට කතා කර....)

බාල පුතා: තාත්තේ ඔබේ දේපළවලින් මට අයිති කොටස දෙන්න.

පියා : (ටිකක් කල්පනා කරයි) ම්...... එහෙනම් පුතේ මෙන්න ඔබේ කොටස. හැබැයි මේවා නාස්තිකර ගන්න එපා.

බාල පුතා: දැන් මට ඇති තරම් සල්ලි තියෙනවා. ඒ නිසා මට දැන් දුර රටකට ගිහිල්ලා විනෝදෙන් ජීවත් වෙන්න පුළුවන්.
(බාල පුතා වෙනත් දුර රටකට පිට ව ගියා. එහි දී ඔහු තමාගේ සම්පත නාස්තිකර දැම්මේ ය)

(තමාට ම කියා ගනියි.)
අනේ මගේ වස්තුව ඔක්කොම ඉවර වෙලා. යාළුවොත් මාව අතහැරලා ගිහින්. මම රස්සාවක්වත් හොයා ගන්න යනවා.
(අවසානයේ ඔහු ඌරු කොටුවක රැකියාවකට ගියේ ය.)

මට බඩගිනියි. ඌරන් කන කෑමවලින් වත් මගේ බඩ පුරවා ගන්න ඕනෑ.
(ඔහුට තම පියාගේ ගෙදර මතක් විය.)

මම තාත්තා ළඟට යනවා. තාත්තා මාව බාර ගනියි ද? ඔව්, මම යනවා.
(ඔහු මෙසේ සිතා, නැවත හැරී ගෙදර ආවේ ය. පියා ආදරයෙන් ඔහු පිළිගත්තේ ය.)



පියා : මගේ බාල පුතා මට නැවත හම්බ වුණා.

පුතා : පියාණෙනි, දෙවියන් වහන්සේටත් ඔබටත් විරුද්ධ ව මම වැඩ කළා.

පියා : මොහුට හොඳ ම සළුව අන්දවන්න. ඇඟිල්ලෙහි මුදුවක් පලඳවන්න. අපි උත්සවයක් පවත්වමු. මගේ නැති වුණ පුතා මට නැවත හම්බ වුණා.

**දෙවියන් වහන්සේ ද අපට අසීමිත ව කමාව දී ප්‍රේමයෙන් අප පිළිගන්නා සේක.**



පැවරුම

1. මෙම උපමා කතාවේ පියාගෙන් සහ බාල පුතාගෙන් ඔබට ගත හැකි ආදර්ශය බැගින් පහත තිත් ඉරි මත ලියන්න.

පියාගෙන් ...................................................
...................................................

බාල පුතාගෙන් ...................................................
...................................................

# 20

# දේව වචනය අසා පිළිපදිමු


(ශුද්ධ මතෙව් 7 : 24-27)



පර්වතයේ ගෙය සෑදුවා ඥානවන්තයා
දෙවි වචනය පිළිගත්තා ඥානවන්තයා
පර්වතයේ ගෙය සෑදුවා ඥානවන්තයා

වැස්සක් වැස්සේ ය.

එය නොසැලී තිබුණා.



වැලි මතු පිට ගෙය සැදුවා අනුවණ මිනිසා
දේව වචනෙ පිළිනොගත්ත අනුවණ මිනිසා
වැලි මතුපිට ගෙය සැදුවා අනුවණ මිනිසා

වැස්සක් වැස්සේ ය.

වැහි වැහැලා වතුර ගලා ගෙය ද යට වුණා///


එය යට වී කැඩුණා.

අපි දේව වචනය අසා පිළිපදිමු.

උපදෙස් :- 20 පාඩමට අදාළ ක්‍රියාකාරකම පිටු අංක 47හි ඇත.


## ක්‍රියාකාරකම - 1 හා 2 පාඩම්

පහත දැක්වෙන රවුමේ නම් කර ඇති කොටස්වලට අදාළ ව දෙවියන් වහන්සේ මැවූ දේවල පිංතූර අඳින්න. පාට කරන්න.



## ක්‍රියාකාරකම් පාඩම් අංක 8

ජේසුස් වහන්සේ බව්තීස්ම ස්නාපනය ලැබූ අවස්ථාව වර්ණ ගන්වන්න.



## ක්‍රියාකාරකම - 10 පාඩම

කුරුලු කූඩුව තුළ  සිටින කුරුලු පවුල පාට කරන්න.



## ක්‍රියාකාරකම - 17 පාඩම

වපුරන්නාගේ උපමා කතාවේ සරු බිමේ වැටුණු බීජවලට සිදු වූ දේ චිත්‍රයට නඟා පාට කරන්න.

## ක්‍රියාකාරකම - 15 පාඩම

1. ඔබ සහ ඔබේ මිතුරාගේ රූප පොත් සලකුණ තුළ ඇඳ පාට කරන්න.
2. රතු තිත් ඉරි මත කපා කොළය ඉවතට ගන්න.
3. පොත් සලකුණ කළු තිත් ඉරි වටා කපන්න.
3. සිදුර විද රිබන් පටියක් ගැට ගසන්න.
4. ඔබේ මිතුරාට එය තෑගි කරන්න.



## ක්‍රියාකාරකම - 20 පාඩම

1. ගෙය අලංකාර කරන්න.
2. රතු තිත් ඉරි මත කපා කොළය ඉවතට ගන්න.
3. ගනකම් කඩදාසියක අලවන්න.
4. කළු පාට කඩ ඉරි දිගේ ගෙය වටා කපා ගන්න.
5. කාමරයේ සුදුසු ස්ථානයක තබා ගන්න.

